**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පෝෂ්‍ය විධායක සේවා ගණය**
**(ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

01.සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

යොමු අංකය: ආ1/බ.ගැ.ප.2010

දිනය : 2012.06.29

1.2 අමාත්‍යාංශය : අධිකරණ අමාත්‍යාංශය

යොමු අංකය: MOJ/E08/රප/බගැප

දිනය : 2013.10.21

1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
යොමු අංකය: DMS/C/3/32/3 දිනය : 2012.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:
යොමු අංකය: EST-2/RECRU/04/2392 දිනය : 2012.10.23

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය: NSCC/4/32/2/SR-1 දිනය : 2013.01.23

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/03-01-32/06/2013 දිනය : 2014.05.12

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03.සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : පෝෂ්‍ය විධායක.

3.2 ශ්‍රේණිය : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

අභිමතානුසාරී බලතල හිමිවන්නා වූ ද, ප්‍රතිපත්ති සම්පාදනය,විධානය හා තීරණ ගැනීමේ කාර්යයට සෘජුවම ඇතුළත් වන්නා වූ ද කාර්ය භාරයක් පැවරෙන සේවා ගණයකි.

04.තනතුරේ ස්වභාවය

ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5.වැටුප

5.1 වැටුප් කේත අංකය : SL-3-2006

5.2 වැටුප් පරිමාණය : රු.42,390-12X1310-58,110

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| විශේෂ ශ්‍රේණිය | 1 වන පියවර | රු.42,390 |

06.සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1.අනුමත තනතුරු නාම අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක | විශේෂ | 02 | 01.අධිකරණ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන හා වෙනත් ආයතන වලින් ,අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා අංශයන්ට ලැබෙන නඩු භාණ්ඩ හා අනෙකුත් සාම්පල් විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම.තවද බැරෑරුම් හා ජාතික වශයෙන් වැදගත් සිද්ධි සම්බන්ධ පරීක්ෂණ කටයුතු වලදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම හා එවැනි පරීක්ෂණ කටයුතු අධීක්ෂණය කිරීම.<br><br>02.අවශ්‍ය අවස්ථාවන්හිදී එම වාර්තා සම්බන්ධයෙන් විශේෂඥ සාක්ෂි දීම.<br><br>03.රසායනාගාර වල විශ්ලේෂණ කටයුතු වලට අදාල වන පර්යේෂණ ක්‍රම දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික දැනුම ලබා දීම.<br><br>04.රසායනාගාර වල පරිපාලනය සහ නියෝජ්‍ය රස පරීක්ෂක ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරුන්/ අංශ ප්‍රධානීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම.<br>05. රසායනාගාරවල කටයුතු දෙපාර්තමේන්තුවේ පරිපාලනමය හා මූල්‍යමය කටයුතු අධීක්ෂණය කිරීම.එම කටයුතු මෙහෙයවීම සඳහා රස පරීක්ෂකට සහය වීම.<br><br>06. පොලිස් නිලධාරීන්,අධිකරණ වෛද්‍ය නිලධාරීන්,මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සහ වෙනත් විමර්ශන නිලධාරීන් සඳහා දේශන පැවැත්වීම සහ පුහුණු කිරීම.<br><br>07.රජයේ සහ අනෙකුත් ආයතන වලට විශේෂඥ හා උපදේශන සේවාවන් සැපයීම.<br><br>08.දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : දෙක(02)ක් වේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා අනුපාතය.

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ. |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

7.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම :

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය: ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (විශේෂ) ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්:

7.4.2.1 මූලික සුදුසුකම්:

I. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය රස පරීක්ෂක තනතුර දරන අයෙකු විය යුතුය.

II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් විශ්ලේෂණ රසායන විද්‍යාව,ආහාර විද්‍යාව හා තාක්ෂණයට අදාළ ක්ෂේත්‍ර,අධිකරණ විද්‍යාව (ධූලක විද්‍යාව,මත්ද්‍රව්‍ය හා මනෝවර්තක,මස්තු විද්‍යාව,අණුක ජීව විද්‍යාව,පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි) ඖෂධ විශ්ලේෂණය,පරිසර විද්‍යාව, ජල තත්ව පාලනය හා කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම .

III. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක නිලධර ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

IV. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ / තනතුරු වලට අදාළ විධායක ශ්‍රේණියේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

VI. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

VII. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන අංශ දෙකෙන් එක් අංශයක ඇති අනු අංශ අතුරින් එක් අනු අංශයක අවම වශයෙන් අවුරුදු දෙකක් බැගින් අවම වශයෙන් අනු අංශ දෙකකවත් විශ්ලේෂණ මට්ටමේ රාජකාරි ඉටුකර තිබීම මගින් විශේෂඥ දැනුමක් තිබිය යුතු වීම සහ පරිපාලන ශක්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.2 කායික සුදුසුකම්:

ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.3 වෙනත්:

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

7.4.3. බඳවා ගැනීමේ ක්‍රමය :

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ.

II. සම්මුඛ පරීක්ෂණ වලදී සේවා පළපුරුද්ද හා කුසලතාවය සැලකිල්ලට ගනු ලැබේ.

III. පවත්නා පුරප්පාඩු වලට අනුව ඉහළම ලකුණු ලබා ගත් නිලධරයන් පත්වීම් බලධරයා විසින් අදාළ සේවා ගණයට/තනතුරට පත් කරනු ලැබේ.

7.4.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිවේදනයක් මඟින් දැන්වීම් ප්‍රසිද්ධියට පත් කිරීම මඟින් .

08. කාර්යක්ෂමතා කඩඉම : අදාළ නොවේ

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ.

10. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

11. සේවයේ රැදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම- අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි: අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන.

"සක්‍රීය සේවා කාලය"යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ.රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය: අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන [signature] පරීක්ෂා කළේ : අත්සන [signature]

(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. පී. පොඩිමැණිකේ නම :

තනතුර : ප්‍රධාන කළමනාකරණ සහකාර, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නො. 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල. තනතුර :

දිනය : 2014/06/23 දිනය : 2014/06/23

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: [signature]

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම :

තනතුර : එස්. තෙන්නකෝන්, ආණ්ඩුවේ රස පරීක්ෂක

දිනය : 30/06/14 නිල මුද්‍රාව:

---

යොමු අංකය-- MOJ/E08/60/ඩගෙල

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හා ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක (විශේෂ)

තනතුර සඳහා යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]

නම :

ලේකම් : ඩබ්ලිව්. කමලිනි එෆ්. ද සිල්වා, ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, අළුත්කඩේ, කොළඹ 12.

දිනය: 2014.07.23 නිල මුද්‍රාව:

---

යොමු අංකය- PSC/EST/03-01-32/06/2013

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක තනතුර සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය 2014-05-12 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්

අනුමත කරන ලදී.

අත්සන: [signature]

නම :

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2014 08 08 නිල මුද්‍රාව:

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.